**වත්තල-මාබෝල නගර සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
**--------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 09 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වත්තල-මාබෝල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ගිණුමේ දක්වා තිබූ සේවක ඇප තැන්පත් ශේෂය රු.207,310 ක් වූ අතර, ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛණය අනුව එය රු.186,818 ක් විය. එම ශේෂය තුල 2015 වර්ෂයේ නිදහස් කරන ලද රු.24,735 ක් වූ සේවක ඇප මුදලක්ද ඇතුලත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට අතැති තොගය රු.2,831,838 ක් වුවත්, උපලේඛණ හා පොත්පත් අනුව ශේෂය රු.1,078,337 ක් වූයෙන් රු.1,753,501 ක වෙනසක් විය.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

2015 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 13 කට අදාලව පාලන ගිණුම අනුව ශේෂයන්ගේ එකතුව රු.250,668,847 ක්වූ අතර ඒවාට අදාල ලේඛන/උපලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.229,844,591 ක් වූයෙන් රු.20,824,256 ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු හා යුතු ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් පවත්වා ගෙන යනු ලබන තැන්පත් ලේඛණයේ දැක්වෙන පරිදි ලැබිය යුතු හා ගෙවිය යුතු ණය ශේෂ (හර හා බැර ශේෂ ) එකට එකතු කර දක්වා තිබූ අතර, ඒවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති පෙර ගෙවුම් ශේෂය රු.20,529,315 ක් වූ අතර, ඒ තුළ ඇතුලත් 2009 වර්ෂයට පෙර ශේෂය රු.18,195,185 ක් විය. මෙම මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.16,485,603 ක්වූ විෂයයන් 03 ක් සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් 2015 දෙසැම්බර් මාසයේදී සභාවට පවරා දී තිබූ වත්තල ඇවිදින මංතීරුව විනාශ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු කර නොතිබුණි.

1.3.6 අධිකාරි බලය නොලත් ගණුදෙනු

පෙර වර්ෂවල ණයහිමියන් සඳහා වෙන්කරන ලද රු.5,498,485 ක මුදලක් සමුච්චිත අරමුදලට ගලපා තිබූ අතර, එම වටිනාකම තුල වූ සියයට 10 ක රු.1,730,070 ක රඳවා ගැනීම් මුදලක් කපාහැර තිබුණි. 2012 නොවැම්බර් 09 දිනැති අංක LED/6/4/12 දරන පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලැබීම පරිදි මුදල් කපාහැරීම සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.14,558,940 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.30,794,403 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ----------------- | ------------------- | --------- | ------------------------- |
| | 000` රු. | 000` රු. | 000` රු. |
| වරිපනම් හා බදු | 67,254 | 55,845 | 63,887 |
| බදුකුලී | 11,106 | 11,385 | 23,474 |
| බලපත්‍ර ගාස්තු | 2,007, | 1,130 | 1,541 |
| වෙනත් ආදායම් | 536,111 | 48,201 | - |

(ආ) නගර සභා ආඥා පනතේ 170(i), 170 (අ) (i) හා 2 වගන්ති ප්‍රකාර අයවිය යුතු බදු,දඩ මුදල් අයකර නගර සභා අරමුදලට බැර කිරිම හා ඒ සඳහා පියවර ගැනිම ලේකම්ගේ කාර්ය වුවද 2015 දෙසැම්බර් 31දිනට රු.53,429,378 ක්වු හිඟ ආදායම් අය කර ගැනීමට පියවර ගෙන නොතිබු අතර 170(2) ප්‍රකාරව රු 67,038,246.ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහාද කටයුතු කර නොතිබුණි.

2.2.2. හැඳළ හන්දිය වෙළඳසංකීර්ණ භූමියේ ඇල අසල බිම බදුදීම.

---------------------------------------------------------------------

(i) හැඳළ හන්දිය ඇල අසල බිම් කොටස් 06 ක් 2002 වර්ෂයේ සිට බදුකරුවන් 06 දෙනෙකුට වර්ෂ 15 ක් සඳහා බදුදීම කර තිබූ අතර, බදු කොන්දේසි ප්‍රකාරව මාසික බදු මුදල් අයකර නොතිබුණි. සමාලෝචිත වර්ෂ අවසානයට අයකර ගතයුතු හිඟ ශේෂය රු.4,565,688 ක් විය.

(ii) ගිවිසුමේ අංක 07 ඡේදය ප්‍රකාරව, වාර්ෂිකව මාසික බදු කුලිය සියයට 10 කින් වැඩිකල යුතු වූවත් එසේ කර නොතිබුණි.

2.2.3 කඩකාමර ඉදිකිරීම සඳහා බිම් කොටස් බදුදීම

----------------------------------------------------

සභාවට අයත් හැඳල හන්දිය වෙළඳ සංකීර්ණ භූමියේ බිම් කොටස් 06 ක් 2002 වර්ෂයේදී බදුදීඇති අතර බිම් කුලිය ගෙවීමෙන් පසු අදාල බිමේ කඩකාමර ඉදිකිරීමේ අයිතිය ගිවිසුමකින් පසුව එක් එක් බදුකරුට හිමිවී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) එක් කඩකාමරයකට අයත් බිම් ප්‍රමාණය වර්ග අඩි 150 ක් වන අතර, ගිවිසුමේ 5 කොන්දේසියේ (ආ) ප්‍රකාරව, අදාල බිමෙහි ඉහල මහලක් තැනීමට අවශ්‍ය වන්නේ නම් බදු මුදලෙන් සියයට 25 ක් අතිරේකව ගෙවිය යුතු වුවත්, අදාල මුදල නොගෙවාම බදුකරුවන් දෙදෙනකු විසින් ඉහල මහල ඉදිකර තිබුණි.

(ii) තවද ගිවිසුමේ 6 කොන්දේසිය ප්‍රකාරව බදු දීමනාකාර පාර්ශ්වය විසින් අදාල දේපල තක්සේරු කර තිබූ රු.220,000 ක මාසික තක්සේරු බදු මුදල ගැණුම්කාර විසින් නියමිත පරිදි ගෙවිය යුතු වුවත්, එයට පටහැනිව වර්ෂ 14 තිස්සේ කිසිදු කුලියක් නොගෙවා කාමර පාවිච්චි කර තිබුණි. තවද නගර සභාවේ බලධාරීන් විසින් කුලී අයකර ගැනීම සඳහා අදාල ක්‍රියා මාර්ග ගෙන නොතිබූ අතර, 2015 දෙසැම්බර් 31 දින වනවිට ලේඛණගත හිඟ ශේෂය රු.4,565,688 ක් වී තිබුණි.

(iii) ගිවිසුමේ ඡේදය 7 ප්‍රකාරව මාසික බදු කුලිය සෑම වසරකම ආරම්භයේ පෙර බදු කුලියෙන් සියයට .එසේ වැඩිකර නොතිබුණි ,ක් වැඩි කලයුතු වුවත් 10

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්ය සාධන ඇගයීම
---------------------------

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් පහත සඳහන් ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළදී නගර සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි .

(අ) කාර්යාල ඉඩකඩ පුලුල් කිරීම හා ගොඩනැගිලි උපකරණ ලබාගැනීම සම්බන්ධයෙන්වූ ක්‍රියාකාරකම් 04 ක්

(ආ) ව්‍යාපාර බදු නොගෙවූ ව්‍යාපාර වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව බලපත්‍ර නොගන්නා ව්‍යාපෘති සඳහා සමාප්ති ආඥාවක් නිකුත් කිරීම සම්බන්ධයෙන්වූ ක්‍රියාකාරකම්

(ඇ) පොදු පහසුකම් සම්බන්ධයෙන්වූ ක්‍රියාකාරකම් 03 ක්

(ඈ) පරිසර කටයුතු සම්බන්ධයෙන්වූ ක්‍රියාකාරකම් 03 ක්

(ඉ) සැලසුම් කිරීමේ හැකියාව හා කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන්වූ ක්‍රියාකාරකම් 06 ක්

(ඊ) සුසාන භූමි හා ආදාහන භූමි ,භූමිදාන ආඥා පණත යටතේ ගැසට් කිරීම හා ප්‍රධාන නගර වලට ඇති දුර සහිතව පිවිසුම් මාර්ග පෙන්වන සංඥා පුවරු සවිකිරීමේ ක්‍රියාකාරකම්

3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ සමාලෝචිත වර්ෂයේ ලංකා බැංකු ජංගම ගිණුමේ රු.15,653,073 ක සාමාන්‍ය මාසික මුදල් ප්‍රමාණයක් පවත්වා තිබුණද, සභාව විසින් මෙම අතිරික්ත මුදල් ආයෝජනය කිරීම කෙරෙහි සලකා බලා නොතිබුණි.

(ආ) මහජන බැංකුවේ ජංගම ගිණුමේ රු.310,673 ක ශේෂය සමාලෝචිත වර්ෂය පුරාම නිශ්කාර්යව පැවති අතර, එය ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට සලකා බලා නොතිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 8 දරණ චක්‍රලේඛය අනුව නාගරික සංවර්ධනය වෙනුවෙන් බැංකු ගිණුමක් විවෘත කළයුතු වුවද, එසේ කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පාලනය

-----------------------

මාබෝල ප්‍රජා ශාලාව ඉදිකිරීම පරීක්ෂාව.

---------------------------------------------

මෙම කර්මාන්තය සඳහා 2014 වර්ෂයේදී රු.1,798,408 ක මුදලකට ගිවිසුම් 03 කට එලැඹ තිබුනි.රු.1,077,139 ක් වැය කර මෙම ප්‍රජා ශාලාවේ ඉදිකිරීම් කටයුතු කර තිබූ අතර, මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ප්‍රජාශාලාව අයිති නගර සභා දේපල සහිත ඉඩමට අදාල හිමිකම් ඔප්පුව විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ii) 2007 ඔක්තෝබර් 19 දිනැති අංක 5720 දරන පිඹුරුපතට අනුව ඉඩමේ ප්‍රමාණය පර්චස් 07 ක් ලෙස සඳහන්ව තිබුණද, 2011 මැයි 05 දිනැති අංක 845 දරන පිඹුරුපතට අනුව ඉඩමේ ප්‍රමාණය පර්චස් 6.9 ක් ලෙස සඳහන්ව තිබූ හෙයින්, ඉඩමේ ප්‍රමාණය අඩුවෙන් සඳහන්ව තිබූ බව නිරීක්ෂණය විය.

(ii) අංක.845 දරන පිඹුරුපතට අනුව ගොඩනැගිල්ලේ නැගෙනහිරට මායිම්ව පිහිටි සභාවට අයිති හිස් බිම්තීරුව එම ඉඩමට යාබද අනිත් පාර්ශ්වයට අයිති වන පරිදි ගොඩනැගිල්ලේ බිත්තියට මායිම්ව නගර සභාව විසින් එහි තාප්පය ඉදිකර තිබූ අතර, එම බිම් තීරුව යාබද පාර්ශ්වය විසින් පරිහරණය කිරීම හා එහි සේදුම් කටයුතු සඳහා යොදාගෙන වැසිකිලියක් ඉදිකර තිබූ බව 2016 පෙබරවාරි 16 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

3.4 ඝන අපද්‍රව්‍ය ගාස්තු අයනොකිරීම

-------------------------------------

බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ 2008 ජූලි 30 දිනැති අංක 1560/6 ගැසට් නිවේදනයේ පළ කර ඇති 2008 අංක 01 දරන "ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති " සියලුම පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කළ යුතු බවට 2010 දෙසැම්බර් 21 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බස්නාහිර පළාත) අංක එල්ජීඩී/05/08/පොදු /වෙළම දරණ ලිපියෙන් දැනුම් දී තිබුණද, නගර සභාව ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි.සමාලෝචිත වර්ෂයේ මේ සඳහා ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණු අතර,වියදම් ඇස්තමේන්තුවක් තිබුණි.මේ හේතුවෙන් රීති මාලාවේ අංක 18(1), අංක 21 ගාස්තු අය කර නොතිබූ අතර රීති අංක 22 ට අනුව ඝන අපද්‍රව්‍ය ආදායමෙන් සියයට 20 ක ප්‍රමාණයක් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අරමුදලට බැර කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා ලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වාහන පාලනය

(ඇ) ආදායම් පරිපාලනය